// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2057/32 - 2018 පෙබරවාරි මස 09 වැනි සිකුරාදා - 2018.02.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට දෙහිවල - ගල්කිස්ස අප ජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය යටතේ අංක 09 පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 පෙබරවාරි මස 06 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1324

#### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 535 පැපිලියාන බටහිර ග්‍රාම නිලධාරී වසමේ පැපිලියාන ගමේ සුනේත්‍රා දේවී පාරේ පිහිටි අංක 481 දරන ව්‍යාපාරික ස්ථානය හා පැරණි ලී බඩු වෙළඳසැලට මැදිව පිහිටි ඉඩමෙන් පර්චස් 03ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | අංක 481 දරන ව්‍යාපාරික ස්ථානය ; |
| *නැගෙනහිරට* | : | කොළඹ - හොරණ පාර (සුනේත්‍රා දේවී පාර) ; |
| *දකුණට* | : | පැරණි ලී බඩු වෙළඳ සැල ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : සොයාගත නොහැක.

02-845

1A - G 27083— 51 (2018/02)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට කටාන ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ බම්බුකුලිය ජල කුළුණ ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 පෙබරවාරි මස 06 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1313

**උපලේඛනය**

ගම්පහ දිස්ත්‍රික්කයේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 64ඒ උතුරු කටාන ග්‍රාම නිලධාරී වසමේ හරක්ගාලේගම ගමේ පිහිටි මිල්ලගහවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ජී. අබේගුණවර්ධන මිය විසින් 2017.05.26 දිනෙන් පිළියෙල කර ඇති අංක 164 දරන සැලැස්මේ කැබලි අංක 2 ලෙස දැක්වෙන සම්පූර්ණ ප්‍රමාණයෙන් රූඩ් 01, පර්චස් 10ක් (හෙක්ටයාර් 0.1265) පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස ඃ

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම සැලසුමේ කැබලි අංක 1 ඉඩම ; |
| *නැගෙනහිරට* | : | නිවාසවල සිට කොච්චිකඩේ මාදම්පැල්ල දක්වා මාර්ගය ; |
| *දකුණට* | : | මෙම සැලැස්මේ කැබලි අංක 3 ඉඩම ; |
| *බටහිරට* | : | යූ. එල්. එස්. එස්. පෙරේරා හිමිකම් කියන ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන්:* 01. එම්. ජී. එම්. ඒ. ටී. ප්‍රනාන්දු මිය,
අංක 485/07,
ඉසුරු උයන,
රද්දොළුව - කොටුගොඩ.

02. පී. ආර්. ආර්. එස්. පුල්ලේ මිය,
අංක 9,
උතුරු කටාන,
කටාන.

02-846

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට කුණ්ඩසාලේ - හාරගම ජල සම්පාදන ව්‍යාපෘතියේ පින්නගොල්ල සේවා ජලාශය හා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා අතිරේක ඉඩම් කොටසක අයිතිය අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 පෙබරවාරි මස 06 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1300

**උපලේඛනය**

මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 986 පින්නගොල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පින්නගොල්ල ගමේ පිහිටි දරනේවත්ත හා පින්නගොල්ල ජනපදය නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 20ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම කොටස් 03 :

කැබලි අංක 01

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | එම්. ජී. ප්‍රේමරත්න මහතා හිමිකම් කියන ඉඩම ; |
| *බටහිරට* | : | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අත්කර ගැනීමට යෝජිත මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. කේ. ධනරාජ් මහතා,
කිරිබෝව, තලාතුඔය.

කැබලි අංක 02

| | | |
|---|---|---|
| *උතුරට* | : | මුරුගේෂ් මහතා හිමිකම් කියන ඉඩම ; |
| *නැගෙනහිරට* | : | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අත්කර ගැනීමට යෝජිත ඉඩම ; |
| *දකුණට* | : | සිසිර හෙට්ටිආරච්චි මහතා හිමිකම් කියන ඉඩම ; |
| *බටහිරට* | : | නිවාසය දක්වා යන ජනපදය පාර. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. සිසිර හෙට්ටිආරච්චි මහතා,
අංක 37, පින්නගොල්ල,
තලාතුඔය.

කැබලි අංක 03

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | නිවාස දක්වා යන ජනපද පාර ; |
| *දකුණට* | : | නිවාසය දක්වා යන ජනපදය පාර ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : එච්. ජී. සෝමරත්න මහතා,
C/A/7/13,
රන්පොකුණගම,
නිට්ටඹුව.

02-847

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට පොල්ගහවෙල - පොතුහැර - අලව්ව ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ ජල පවිත්‍රාගාරයට ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 පෙබරවාරි මස 06 වැනි දින,
අංක 35, "ලක්දිය මැඳුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1338

උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 932 ටැංපාන ග්‍රාම නිලධාරී වසමේ ඊදැල්ල ජනපදය ගමේ ඊදැල්ල ජනපදය නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 11.00ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස් දෙක :

01. කැබලි අංක : 01 ඉඩමේ නම : ඊදෑල්ල ජනපදය ප්‍රමාණය : පර්චස් 5.5ක් පමණ.

*උතුරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*නැගෙනහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*දකුණට* : පොල්ගහවෙල සිට රඹුක්කන මාර්ගය ;
*බටහිරට* : අත්කර ගැනීමට යෝජිත කැබලි අංක 02.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. ටී. එම්. නිමල් රණතුංග තෙන්නකෝන් මයා,
අංක 132,
ඊදෑල්ල ජනපදය, පනලිය
පොල්ගහවෙල.

02. කැබලි අංක : 02 ඉඩමේ නම : ඊදෑල්ල ජනපදය ප්‍රමාණය : පර්චස් 5.5ක් පමණ.

*උතුරට* : අත්කර ගැනීමට යෝජිත කැබලි අංක 01 ;
*නැගෙනහිරට* : අත්කර ගැනීමට යෝජිත කැබලි අංක 01 ;
*දකුණට* : පොල්ගහවෙල සිට රඹුක්කන මාර්ගය ;
*බටහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. ඊ. රුවන් වික්‍රමසිංහ මයා,
අංක 134,
ඊදෑල්ල ජනපදය,
පනලිය, පොල්ගහවෙල.

02-848

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.